# රිටිගල කන්ද

## (අරිට්ඨ පබ්බත, රකුන්ගිර, සත්නාගිර, රැකවරණ කන්ද, භයංකාර කන්ද)

**ගමනේ අරමුණ:** රිටිගල ආශ්‍රිත ඉතිහාසය, නටබුන්, ආරණ්‍ය සේනාසන, පිළිබඳව කරුණු අධ්‍යයනය, රාවනා රජු සමයට සම්බන්ධ තොරතුරු එක් රැස්කර ගැනීම

**සංචාරය කල දිනය :** 2015 මැයි 01 වන දින

**සහභාගීවූවන් ගණන:** 3 යි (නිශාන් කුළසිංහ, ලසිත රත්නායක, මධුජිත් රාජකරුණා)

**ගමන් කල ආකාරය:** 4WD SUV රථයකින්

**විශේෂ ස්තුතිය:** මධුජිත් රාජකරුණා(සිය SUV රථයෙන් ගමන් පහසුකම් සැපයීම)

**ගමනේ ස්වභාවය:** වාහනයකින් ගමන් කල නිසා කොළඹ සිට ගමනාන්තය දක්වා ළගාවීම අපට අපහසුවක් නොවීය. ඉන්පසු කොටස පාගමනින් යා යුතු අතර එය අපහසු දායක ගමනක් නොවේ.

**ඇතුල්වීම:** පුරාවිද්‍යා නටබුන් ඇති කොටස සඳහා පෙර අවසරයක් අවශ්‍ය නැත. එහෙත් ඇතුළුවීමට පෙර කාර්යාලයට ඔබගේ තොරතුරු ලබා දීමට සිදුවනු ඇත. දැඩි රක්ෂිත වනාන්තර ප්‍රදේශයට ඇතුල්වීමට අවසර නොමැත. එයට ඇතුළුවීමට කොළඹ වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් විශේෂ අවසරයක් අත්‍යාවශ්‍ය වේ.

www.LakViskam.org

**ඡායාරූපහා වාර්තාව:** නිශාන් කුළසිංහ විසිනි.

**කොළඹ සිට ගමන් මාර්ගය:**

- දඹුල්ල > හබරණ (ත්‍රිකුණාමලය මාර්ගයේ ගොස් වමට හරවා)> 10 km පමණ මරදංකඩවල දෙසට > රිටිගල නාම පුවරුව ලගින් දකුණට හැරී ගමන් කරන්න (සිතියමේ නිල් පැහැති මාර්ගය)

- දඹුල්ල > කැකිරාව (A9 අනුරාධපුර මාර්ගය ඔස්සේ) >කැකිරාවෙන් දකුණට හරවා ගනේවල්පොල මාර්ගය> ගනේවල්පොල මංසන්ධියෙන් දකුණට හරවා මරදංකඩවල - හබරණ මාර්ගයේ 5 km පමණ ගොස් රිටිගල නාම පුවරුව ලගින් වමට හැරී ගමන් කරන්න (සිතියමේ අළු පැහැති මාර්ගය)

**අප ගමන් කල මාර්ගය**

- කොට්ටාව > නුගේගොඩ > කැලණිය > කටුනායක > මීනුවන්ගොඩ > දිවුලපිටිය > ගිරිඋල්ල > නාරම්මල> වාරියපොළ > හිරිපිටිය > මඩගල්ල > බුල්නැව > අවුකන >මරදංකඩවල> රිටිගල



www.Lakviskam.org

දඹුල්ල සිට රිටිගලට ගමන් මාර්ග

**පරිසරය පිළිබඳව**

රිටිගල, උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මරදංකඩවලට ආසන්නයෙන් අක්කර 7200ක භූමි ප්‍රමාණයක් පුරා විහිදී ඇති කඳු පංති, වනාන්තර වලින් ගහන දැඩි රක්ෂිතයකි. එය වටා අලගොල්ලෑව, මුල්කිරියාකඩවල, සේනාදිරියාගම, හඳපාගම, ගලපිටගල, ඌත්තුපටිය, මොරගොඩ, කීරියගස්වැව, හීනුක්කිරියාව, ගනේවල්පොල, කළුඑබේ, මුරියා,බමුණු ගම,කඩවල,ඇතුළුගම්මාන 14ක් පිහිටා ඇත.රිටිගල කන්ද මුහුදු මට්ටමේ සිට මීටර් 766ක උසකින් යුක්ත වේ. තෙත්කලාපීය දේශගුණ ලක්ෂණ දක්නට ඇති අතර අවුරුද්ද පුරා ජලය සපයන සියුම් උල්පත් දක්නට ඇත. වසර කිහිපයකට පෙර සිදී ගිය අලංකාර දිය ඇල්ලකින් පවා යුක්ත වූ මෙහි එම දිය ඇල්ල වර්ෂා කාලයේ පමණක් සක්‍රීය වන බවට පැවසේ. මෙහි සාමාන්‍ය උෂ්ණත්වය සෙලිසියස් අංශක 27ක් පමණ වන අතර වාර්ෂිකව ලැබෙන වර්ෂාපතනය මිලි ලීටර් 1000ත් 2000ත් අතර අගයක් ගනී.මෙහි ඉතාමත් දුර්ලභ ශාක හා සතුන් සහිත උද්භිද විද්‍යාත්මක වැදගත්කමක් ඇති ඓතිහාසික නටබුන් සහිත පරිසරයකි.රිටිගල පරිවාර කඳු වළල්ලකින් යුක්තය. අඹරාපති කන්ද, නා උල්පත් කන්ද, පළතුරු කන්ද, ආඩියා කන්ද, උණ කන්ද, කොඩිගල කන්ද, ඖෂධ කන්ද, යන නම්වලින් ඒවා හඳුන්වයි.



රිටිගල දිය ඇල්ල *



හනුමා විසින් බෙහෙත් කඳු කොටසක් ඉන්දියාවෙන් රැගෙන ඒම *

1887 දී ඉංග්‍රීසි ජාතික හෙන්රි රිච්මන් මහතා කඳු වැටියේ උද්භිද විද්‍යාත්මකව ඇති වැදගත්කම පිළිබඳව අධ්‍යයනයක් කර ඇත. ශාඛ වර්ග 337කින් 57ක්ම ලංකාවට ආවේනික ශාඛ වේ. එකිනෙකට වෙනස් වූ පරිසර පද්ධති 3ක් රිටිගල ආශ්‍රිතව දක්නට ලැබේ. කන්දේ පහලම කොටස වියලි හා මිශ්‍ර සදා හරිත වනාන්තරයක ලක්ෂණ පෙන්වයි. පලු, හල්මිල්ල, කලුවර, මොර, නා, සහ වීර වැනි ශාඛළුම කොටසේ දක්නට ලැබේ. කන්දේ මැද කොටස තෙත්කලාපීය වනාන්තරයක ලක්ෂණ උසුලයි. එහි නා, කැන්ද, ඇටඹ, කුඩුදවුල, ඔමාර වැනි ශාක දක්නට ඇත. කන්දේ මුදුන් කොටස කඳුකර වනාන්තර ලක්ෂණ පෙන්වන අතර එහි බිනර, නෙළු, කැකුණ, දුම් ශාඛ දක්නට ඇත.සමහර කාලවල කන්ද මීදුමින් වැසී පවතී. රිටිගල ගල් කප්පරවල්ලිය, රිටිගල තම්බර්ජියා, රිටිගල නෙළු, රිටිගල වන මී, රිටිගල උණ, යනාදී ලෙස නම් කර ඇති, රිටිගල වනාන්තරයට ආවේනික ශාක වර්ග 5 ක්ද හඳුනාගෙන ඇත.දුර්ලභ ඖෂධ ශාඛ වන අරළු, බුළු, නෙල්ලි, බිංකොහොඹ, වල්නවහන්දි, මහහැඩයා, රණවරා, පට්ඩතු, කොතලහිඹුටු, ගම්මාලු, සැවැන්දරා, ඉර රාජ, සඳ රාජ, වන රාජ, බිම් කොහොඹ, ජටා මකුල, නගා මැරු අල, වෙල්ලන්ගිරිය, රුදන්ති, සන්සෙව්,ඇතුළු ඉතා වටිනා බෙහෙත් පැළෑටි රසක් රිටිගල දක්නට ඇත.පක්ෂි විශේෂ 97ක් පමණ මෙහි ජීවත්වන අතර ඉන් 8ක් ශ්‍රී ලංකාවට ආවේනික වේ.දිවියා, අඳුන් දිවියා, තිත් මුවා, ගෝනා, වලසා, වල් ඌරා, පිඹුරා වැනි සතුන් වනාන්තර කොටසේ ජීවත් වේ. රිටිගල කඳු පන්තියේ අක්කර 690ක ප්‍රදේශයක් පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව යටතේ පවතී. සමස්ත කඳු පන්තිය හා වනාන්තරය, දැඩි රක්ෂිතයක් ලෙස වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව මගින් පාලනය වේ. එයට ඇතුළු වීම සපුරා තහනම්ය.

www.lakviskam.org

**ජනප්‍රවාද හා ඓතිහාසික පසුබිම**

මහා වංශයරිටිගල "අරිට්ඨ පබ්බත"නොහොත් ආරක්ෂිත කන්ද ලෙස හඳුන්වයි. ජනප්‍රවාද වලදී භයංකාර කන්ද, රැකවරණ කන්ද ලෙසද එය හඳුන්වා ඇත. රිටිගල ආදී යක්ෂ ගෝත්‍රිකයින්ගෙන් ජනාවාස වී තිබූ ප්‍රදේශයක් ලෙසට සාක්ෂි ඇත. අප්‍රකට ඓතිහාසික වරිගපුර්ණිකා පුස්තකයට අනුව මහා ගිරි හෙවත් ශ්‍රී පාදය මුලික කරගත් ප්‍රාදේශීය රාජ්‍යයන් කිහිපයක් යක්ෂ ගෝත්‍රික පාලන සමයේ තිබී ඇත. ඉන් එකක් රකුන්ගිර ලෙස හඳුන්වයි. රකුන්ගිර යනු එකල රිටිගල ප්‍රදේශයට භාවිතා කෙරුණු නාමයයි. සත්නාගිර යන නාමයද භාවිතා කර ඇත. වරිගපුර්නිකාවට අනුව බුදුන් වහන්සේ රකුන්ගිරටද වැඩම කර ඇත්තාහ. රාවනා රජු විසින් සීතා දේවිය මෙරටට රැගෙනවිත් රඳවා තබාගෙන තිබූ කාලයේදී ඇය සොයා පැමිණි ලක්ෂ්මනට තුවාල සිදු විය. ඊටප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ ගෙන ඒමට භාරත දේශයට ගිය හනුමන්තා හට නිවැරදි ඖෂධ පැල තෝරා ගැනීමට අපහසු වූ නිසා හිමාලය කන්දෙන් කොටසක් අහසින් රැගෙන

එන ලදී. එම කන්දෙන් කොටස් ගැලවී බිම වැටී රිටිගල ඖෂධ කන්ද නිර්මාණය වූ බවට ජනප්‍රවාදයක් පවතී.රටේ අනෙකුත් ප්‍රදේශවල බහුලව දක්නට නොමැති බෙහෙත් වර්ග රැසක් හනුමා ගෙන ආ කන්දෙන් කැඩී වැටී නිර්මාණය වුයේයයි පැවසෙන රිටිගල "ඖෂධ කන්දේ" හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ "දොළු කන්දේ" දක්නට ඇත.ඒ අතරවන රාජ, ඉර රාජ, සඳ රාජ, බිම් කොහොඹ, ජටා මකුල, නගා මැරූ අල, වෙල්ලන්ගිරිය, රුදන්ති වැනි වටිනා ඖෂධ මුල්තැන ගනී.එසේම වේදනා නසා දීර්ඝායුෂ ගෙන දෙන "සන්සෙව්" ශාඛද මෙහි දක්නට ඇත.මෙවන් දුර්ලභ ඖෂධ පිරි රිටිගලට "රිටිගලත් හනුමන්තාගේ බෙහෙත් කැලෑව වගේ" යනුවෙන්පැරැන්ණන් අතර කියමනක්ද පට බැඳී ඇත. පසුකාලීනව දුටු ගැමුණු රජු එළාරට විරුද්ධව යුද වැදීමට සේනා සංවිධානය කර ඇත්තේද රිටිගල ආශ්‍රිතවය. දුටු ගැමුණු රජතුමාගේ දස මහා යෝධයන්ගෙන් කෙනෙකු වූ ගෝඨයිම්බර සමග බිහිසුන සටනක්කර පරාජය වූ රිටිගල කන්දේ විසූ රිටිගල ජයසේන මෙහිදී සඳහන් කල යුතුමය. සොහොන් බිමක සිදු වූ එම ද්වන්ධ සටනින් ජයසේනගේ හිස ශරීරයෙන් වෙන් වී ගොස් රිටිගල ආසන්න කරඹ ගසක රැඳී ඇත. එම ස්ථානය වර්තමානයේ "ඔළුකරදන" ලෙස හඳුන්වයි. එසේ හිස වෙන්  වූ ශරීරයේ ප්‍රාණය රැකගැනීමට පිණිස, 'සෙනසුරු'විසින් ත්‍රිකුණාමලය මරතඩිය හන්දිය අසල පිහිටි සෙනසුරු කෝවිල් බිමෙන් වලසකුගේ හිසක් ගෙන විත් කලබලයෙන්මුහුණ පිටුපසට සිටිනසේ ජයසේනගේ කවන්ධයට සවි කිරීමෙන් "මහසෝනා" බිහි වූ බවට කිය වේ. රිටිගල සුදලිය අංගං සටන් සම්ප්‍රදායේ නිර්මාතෘ ලෙසද රිටිගල ජයසේන සලකයි. මහාවංශය රචනා කල මහානාම හිමියන් සතුරු ආක්‍රමණ ආදී අවධි වලදී දුටු ගැමුණු රජු, පණ්ඩුකාභය කුමරු, ජෙට්ඨතිස්ස රජු ආදීන් සිය සේනා සංවිධානයට රිටිගල කඳු පන්ති යොදාගෙන ඇත. එවැනි ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස සේනාදිරියාගම වැනි ඓතිහාසික ගම්මාන නාම බිහි වී ඇත.දේවානම්පියතිස්ස, දුටු ගැමුණු, මහසෙන් රජදරුවන් රිටිගල ආශ්‍රිතව සංවර්ධන කටයුතු සිදු කර ඇති අතර ක්‍රි.පු.59-50 කාලයේදී ලජ්ජිතිස්ස රජු අරිට්ඨ විහාරයද ක්‍රි.පු. 187 - 177 කාලයේදී සූරතිස්ස රජු ලංකා විහාරයද (සංඛ විහාරය) ක්‍රි.පු. 835-833 පළමුවන සේන රජ සංඝයා වහන්සේට ආරාමයක් ඉදි කල ඇති බවට ඓතිහාසික තොරතුරු වලින් කියවේ.

මෙරට පළමු මහ රහතන් වහන්සේ ලෙස මහා වංශය සඳහන් කරන අරිට්ඨ රහතන්වහන්සේ ඇතුළු 500 නමක් වූ සංඝයා වැඩ සිටි මෙම රිටිගල ආශ්‍රිත ප්‍රදේශයේ කටාරම් සහිත ගල් ලෙන් 74ක්, බ්‍රාහ්මීය අක්ෂරයෙන් කරවන ලද සෙල් ලිපි 152ක්, ඓතිහාසික ගොඩනැගිලි 140ක පමණ නටබුන් දැනට සොයාගෙන ඇත. ඒවායින්  එළිමහන් ප්‍රදේශවල පිහිටා ඇති නටබුන් ක්‍රමයෙන් විනාශ මුඛයට යමින් පවතී. ආදී වාසි වැදී ජනතාව රිටිගල ආශ්‍රිතව අතීතයේදී ජීවත් වී ඇති බවටද සැලකේ. 11 වන සියවස දක්වා ආරණ්‍ය වාසී සංඝයා වහන්සේට කැප වී තිබූ රිටිගල චෝල ආක්‍රමණයෙන් පසු විනාශ වී වනාන්තරයට වැසී යන ලදී.1872 දී මේස් මාර්ක්වෙල්නම් බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥයා විසින් කරන ලද ගවේෂණ කටයුතු නිසා නැවත රිටිගල කරලියට පැමිණියේය. පසුව එච්.සී.පී. බෙල් මහතා විසින්ද ගවේෂණ සිදුකර වාර්තා ද්විත්වයක් නිකුත් කරන ලදී.1941 නොවැම්බර් 07 වන දින අංක 8809 දරණ රජයේ ගැසට් නිවේදනයෙන් රිටිගල වර්ග කිලෝ මීටර් 5.28ක ප්‍රදේශයක් දැඩි රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

www.LakViskam.org

**අපගේ රිටිගල ගමන**

උදෑසනම ගමන ආරම්භ කරමින් ලසිත සමගින් මාගේ මෝටර් රථයෙන් කැලණියේ පිහිටි මා මිත්‍ර මධුජිත්ගේ නිවසට ගියෙමු. එහි සිට ඔහුගේ SUV රථයෙන් උදෑසන 5.45 වන විට ගමන් ආරම්භ කළෙමු.මෙම ගමනේ විශේෂත්වයක් නම් මුල්කොටසේ හමු වූ නගර කිහිපය හැරුණු කොට ඉතිරි ප්‍රධාන නගර සියල්ලම මගහරිමින් රිටිගල දක්වාම ගමන් කිරීමයි. මේ සඳහා අප චන්ද්‍රිකා සිතියම් භාවිතා කරමින් අතුරු මාර්ග, ගුරු පාරවල් හදුනා ගනිමින් ඒ ඔස්සේ ගමන් කළෙමු. මේ නිසා අපට කිසිදු අවස්ථාවකදි වාහන තදබදයකට මුහුණ දීමට සිදු නොවීය.ඇතැම් අතුරු මාර්ග තරමක් දුෂ්කර හා අබලන් තත්වයේ පැවතුනත් අප රථය ඒවාට හොඳින් ඔරොත්තු දුන් නිසා ගැටළුවක් නොවීය. මෙම ක්‍රමයට ගමන් කිරීම අප තිදෙනාටද නැවුම් අත්දැකීමක් ගෙන දෙන්නක් විය.අතරමගදී උදෑසන ආහාරයද ලබාගත්තෙමු. ගමන අතරමග අවුකන බුදු පිළිමය හා විහාරස්ථානය වන්දනා කිරීමට තීරණය කල අප උදෑසන 9.30 වන විට

එහි ළඟා වීමු. පැය භාගයක් පමණ විහාරස්ථානය වන්දනා කර එය නරඹා නැවත ගමන් ආරම්භ කළෙමු. පෙ.ව. 10.05 පමණ වනවිට කලා වැව අසලට ළඟා වූ අප වාහනයෙන් බැස අවට සුන්දරත්වය වින්දෙමු. වැවට එපිට ඇතින් රිටිගල කඳු පන්තිය ඇතුළු අනෙකුත් කඳුද ඉතා අලංකාර ලෙස දර්ශනය විය.


කලාවැවට ඔබ්බෙන් දර්ශණය වන රිටිගල කඳු


රිටිගල දිය පාරක්

පෙ.ව. 10.42 ට රිටිගලට හැරෙන මාර්ගය අසලට පැමිණි අප නාමපුවරු අනුව වමට හැරී පටු පාළු මාර්ගයක් ඔස්සේ 6 km ගමන් කළෙමු.විනාඩි 10කින් අප රිටිගල තොරතුරු හා පර්යේෂණ මධ්‍යස්ථානයට පැමිණියෙමු. එහි කුඩා නිවාස කිහිපයක් ඇති අතර අපගේ මග පෙන්වන්නා දයාරත්නඅප සමග එකතු විය. ඔහු සමග වමට හැරී පටු පාරක් දිගේ තවත් කිලෝමීටර් 2ක් පමණ වනාන්තරය ඇතුලට ගිය විට පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ කලාප කාර්යාලය අසලට පැමිණිය හැක. එහි වාහනය නතරකර ඉතිරි කොටස පයින් ගමන් කල යුතුය.ඇතුළු වීමට ප්‍රථම ඔබගේ නම ලිපිනය ඇතුළුවන වෙලාව ආදී තොරතුරු සටහන් කර අත්සන් ලබා ගනු ලබයි. එතැන් සිට ක්‍රමයෙන් පුරා විද්‍යා භූමියේ ඇති දෑ නැරඹිය හැකි අතර අතීතයේදී කළුගල් කඩා වෙන් කිරීම පිණිස තැනතැන සිදුරුවිද ඇති අයුරු නිරීක්ෂණය කල හැක.හෙක්ටෙයාර් 8ක ශිලාමය යෝධ පොකුණක නටබුන් ඔබට දක්නට ලැබෙනු ඇත. එය "බන්දා පොකුණ" නම් වේ. එය දකුණු ආසියාවේ ඇති විශාලම ශිලාමය පොකුණ වන අතර ජල ගැළුම් මිලියන දෙකකට අධික ජල ප්‍රමාණයක් පිරවිය හැක.එහි ගල් පඩි ආකාරයන් සියුම්ව කපා එකිනෙකට සම්බන්ධ කර බැමි හා පඩි සකස් කර ඇති අකාරය පුදුම උපදවයි.එහි සම්පූර්ණ බැම්මම අද දක්නට අපහසු අතර ඉතුරු කොටස වනාන්තරයෙන් වැසී ඇත.මෙම පොකුණ රිටිගල වැඩ සිටි සංඝයා වහන්සේගේ පැන් අවශ්‍යතා සඳහා භාවිතා කරන්නට ඇත.


බන්දා පොකුණ


කළුගලින් නිම කල පඩි සහිත මාර්ගය

www.Lakviskam.org

විශාල මැටි තුඹස්ද අවට දක්නට ඇත. අවුරුද්ද පුරාම පවතින සියුම් දිය සීරාවක් දක්නට ඇත. පොකුණට පිටුපසින් ඉතාමත් ප්‍රිය උපදවන ආකාරයට කළු ගල් පඩි ආකාරයට සකස් කර ගමන් මාර්ගයසාදා ඇත. විටෙක පඩි ලෙසත්, ඇතැම් තැනෙක ගල් පුවරු බිම අතුරා ඉතාම ක්‍රමානුකූලව ගමන් මාර්ගය සකසා ඇත. ඇතැම් තැනෙක සුදුසු පරිදි කැටයම් ආදිය යොදා අලංකාර කර ඇත. ගිමන් හල් ලෙස නම් කර ඇති ස්ථාන වල විශාල වෘත්තාකර හැඩයෙන් ගල් පුවරු සහ වේදිකා සකස් කර ඇත.

ගල් පාලම්, පධානාඝර, ජන්තාගාරය (ආයුර්වේද රෝහල), ශීලාමය පහන්, ඔප දැමූ ගල් පුවරු, සලපතල මළු, ගිමන් හල්, බෙහෙත් ඔරු, ගල් ආසනහා සයනආදිය ඔබට ඉදිරියට ගමන් කරද්දී ක්‍රමයෙන් දැක ගත හැක.මෙහිදී ආයුර්වේද රෝහල පිළිබඳව පරීක්ෂා කර බලද්දී එය මූලිකවම කළුගල් ආශ්‍රයෙන් කර ඇති බව පෙනී යයි.කළු ගලින් සකසා ඇති බෙහෙත් ඔරු, උණු වතුර ටැංකි ආදියෙහි ඇති ඖෂධ තෙල්, ජලය පිටතට ගලා යාම පිණිස සකස් කර ඇති කාණු පද්ධතිය ඉතා හොඳින් සැලසුම් කර ඇත.බෙහෙත් දැමීමට යොදා ගත් ගල් කෝව ආදියද දැකිය හැක. මෙම රෝහල් භූමියට කොඩිගල කඳු මුදුන හොඳින් දර්ශනය වේ.


රෝහල


කළුගල් පෙත් මග

www.LakViskam.org

ශිලාමය පෙත් මං ඔස්සේ කන්ද මුදුනට ගමන් කරන විට කළුගල් ලෑල්ලක් යොදා සකස් කල ගල් පාලමක් මතින් පුස්තකාලය නොහොත් පොත්ගුලට පිවිසිය හැක. මෙම ස්ථානය සාමාන්‍ය ගමන් මගෙන් මදක් බැහැරව තිබෙන නිසා බොහෝ දෙනෙකුට මග හැරී යා හැක. මෙම ස්ථානයෙන් දිය පහරක් ගලා බසින නිසා එහි නාදයත් සමග ඉතා නිස්කලංක බවක් පවතින අතර පොත් කියවීම සඳහා ගල් කොට්ටයක් සහිත ආසන සකස් කර ඇත.

තවත් ඉදිරියට ගමන් කර වනාන්තරය තුල පිහිටි කටාරම් කෙටු සෙල් ලිපි සහිත විශාල ගල් ලෙනකට පිවිසිය හැක. එහිද ගල් ආසන සකස් කර ඇත. තවත් ඉහලට ගමන් කිරීමේදී නැවතත් ගල් ආසන ආදිය ගමන් මාර්ගය ආසන්නයේ දැකිය හැක. එසේම කන්ද මුදුනේ සිට වැසි ජලය ගලා ඒමට යොදා ඇති පීලි ආදියෙහි නටබුන් දැක ගත හැක. මනාව සකස් කල ඉතා ගැඹුරු වලවල් සහිත වැසිකිලි ආදියද එහි වේ. තවත් ඉදිරියට ගිය විට කඩා බිඳ දමා ඇති ගල් සයන හා විවිධ නිර්මාණ වනාන්තරයේ බිම විහිදී යට වී ඇති අයුරු දැක ගත හැක.



මුත්‍රා කිරීමට සැකසු ගල



පැරණි නුග ගහ

වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් ඇතුළුවීම තහනම් බව දැක්වෙන දැන්වීම් පුවරු වනාන්තරය කෙලවරට වන්නට සවි කර ඇත. උණ කන්ද ආදී අනෙකුත් කඳු වලට පිවිසෙන ස්ථාන අවහිර කර අලි වැටකට සමාන වැටක් ඉදි කර තිබෙනු දක්නට ඇත. කන්දෙන් පහල පිහිටි පුරාවිද්‍යා කාර්යාල භූමියට ජලය ගෙන සපයන ටැංකිය නිල්පැහැ ජලයෙන් පිරී ඇති අයුරු දක්නට හැක. නටබුන් අතර ඇති මුත්‍රා පහ කිරීමට සකස් කර ඇති අඩි දෙක හමාරක් පමණ පළලින් යුතු අලංකාර කළුගල් ලැල්ලක්ද වේ.ඉතාමත් පැරණි යෝධ නුගගසක් මෙම වනාන්තරයේ දක්නට ඇත. ඊට නුදුරින්විශාල කළුගල් මත සිටිනා යෝධ පිඹුරෙකු මෙන් දිස් වෙන "වෙම්බඩන්ගා" වැල්දැකිය හැක.

www.Lakviskam.org



වෙම්බඩන්ගා වැලක්



කීරියගස්වැව වැව

රිටිගල නටබුන් රිසිසේ නැරබීමෙන් පසු ගමන ආරම්භ කල ස්ථානයට ප.ව. 1.45 වන විට නැවත පැමිණියෙමු. අප වාහනයේ නැගී රිටිගලට ආ ගමන්මගේතරමක් දුෂ්කර මාර්ගයකින් ආපසු ගොස් "ආඩිය කන්ද අරණ්‍ය සේනාසනයට" ගොස් එහි ඇති ලෙන් විහාර, සෙල් ලිපි ආදිය නරඹා සේනාසනයට ආධාර ද ලබාදුන්නෙමු. තෙහෙට්ටුව මගහරවා ගැනීමට වැවකින්  ස්නානය තීරණය කල අප නැවත රිටිගල පසු කර කීරියගස්වැව බලා පිටත් වුනෙමු. ඉතා පටු බොරළු මාර්ග ඔස්සේ ඉතාමත් දර්ශනීය කීරියගස් වැව එළිමහන් ගම්මානය තුලින් ගොස් කීරියගස් වැවට පිවිසුනෙමු. එම ගම්මානයේ ඉතා විශාල වශයෙන් ගව

රංචු ඇති කරන අයුරු දක්නට ලැබිණි. එහෙත් එම ගවයන් ඇති කරන්නේ මස් පිණිස විකිණීමට යයි අසා අප බොහෝ සංවේගයට පත් වූයෙමු. රිටිගල කඳුයාය මැනවින් දර්ශනය වන මෙම වැවෙන් රිසි සේ නා නැවුම් ගතින් යුතුව අප මග පෙන්වන්නා හට සමු දී සවස 4.00 ට කොළඹ බලා ඒමට පිටත් වූයෙමු.

**අතිරේක යොමු**

අප සංචාරයේ තවත් ජායාරූප එකතුවක් පහත යොමුවෙන් නරඹන්න.

https://picasaweb.google.com/102500057347588371605/RitigalaAnuradhapura

---

* "රිටිගල දිය ඇල්ල" හා "හනුමා විසින් බෙහෙත් කඳු කොටසක් රැගෙන ඒම" ජායාරූප අන්තර් ජාලයෙන් උපුටා ගන්නා ලදී. රිටිගල දිය ඇල්ල ජායාරූප අයිතිය පාලිත අතුකෝරල (http://www.panoramio.com/photo_explorer#view=photo&position=59&with_photo_id=17454020&order=date_desc&user=2311867)

"හනුමා විසින් බෙහෙත් කඳු....."(http://viyanpoonamallee.com/2013/01/wukong-the-monkey-king-compared-with-hanuman-the-monkey-god)

---

මෙම වාර්තාවේ අයිතිය “ලක් විස්කම්”වෙබ් අඩවිය සතුය.©www.lakviskam.org (2015දෙසැම්බර් 30)
විමසීම්සහ අදහස් : lakviskam@gmail.com

www.LakViskam.org